# ශ්‍රී ලාංකේය ආභරණ සහ පුරාණ සමාජය

එල්.ඩබ්. සෙව්වන්දි[1], ජී.සී.සී. පෙරේරා[2], එච්.එම්.ආර්.එස්.ඩී. බණ්ඩාර[3]

සමාජය හා සංස්කෘතික සංවර්ධනය පිළිබිඹු කරන ප්‍රධාන මානයක් ලෙස පුරාණයේ ආභරණ සැලකිය හැකිය. මානව සමාජය ශිෂ්ටවත්ම බාහිර අලංකරණ සඳහා විවිධ වූ ආභරණ පැළඳීමට යොමු විය. එසේ පැළඳි ආභරණ තුළින් පුරාණ සමාජ පැතිකඩ පිළිබඳ හෙළිවන්නේ ද යන ගැටළුව මුල් කරගනිමින් සිදු කරන ලද මෙම අධ්‍යයනයට යොදා ගත් ක්‍රමවේදය ලෙස ද්විතික මූලාශ්‍රය පරිහරණය, අන්තර්ජාල පරිහරණය ඔස්සේ දත්ත රැස්කරන ලදී. අතීත සමාජය හෙළිකර ගැනීමේදී උපයෝගී කරගත හැකි වටිනා පුරාවිද්‍යාත්මක සාධකයක් ලෙස පැරණි ආභරණ හඳුන්වාදිය හැකිය. මිනිසා ආභරණ පරිහරණය ආරම්භ කල අවධියේ පටන් ස්ත්‍රී පුරුෂ භේදයකින් තොරව ශරීරාංග, ප්‍රත්‍යාංග අලංකාර කිරීමට මේවා පැළඳි බවට සාධක හමුවේ. තත්කාලීන සමාජයේ ජනයාගේ ආකල්ප සහ සංකල්ප අධ්‍යයනය කිරීමේ දී පුරාණ සමාජ තාක්ෂණය අධ්‍යයනය කිරීමට ද ආභරණ වැදගත් සාධකයක් වේ. අමුද්‍රව්‍ය ලබාගැනීමේ සිට නිමි ද්‍රව්‍යය බවට පත්කිරීම දක්වා ශිල්ප ක්‍රම මෙයින් දැනගත හැකිය. බෙලි කටු, මැටි, රන්, රිදී, මැණික් ගල්, පලිගු, ආදී අමුද්‍රව්‍ය ආභරණ බවට පත්කර ඇති අතර පැරණි සමාජය තුළ ස්වර්ණාභරණ කර්මාන්තයේ නියැලුණු ශිල්පීන් පිළිබඳ තොරතුරු අනාවරණ වේ. ලක්දිව ආභරණ තුළින් එකල සමාජය තුළ තිබූ ඇදහිලි හා විශ්වාස පිළිබඳ අධ්‍යයන කළ හැකි වේ. අලුත්නුවර පත්තිනි, සූනියම්, දැඩිමුණ්ඩ, වැනි දෙවිවරුන්ට අනන්‍ය වූ ආභරණ පැවති අතර අදහන්නන් ද විවිධ ආභරණ පැළඳ ඇත. මහනුවර යුගයේ සමාජ ස්තරායනය, තනතුර හා සමාජ පන්තීන්ට අයත් ආභරණ පැළඳි බව මූලාශ්‍රය අධ්‍යයනයෙන් සහ සිතුවම් මූර්ති අධ්‍යයනයෙන් හඳුනා ගැනීමට හැකියාව ලැබේ. පුරාණ සමාජයේ ආභරණ විවිධත්වය එම ආභරණ පැලඳු අවස්ථා මොනවා ද යන්නත් ඉන් අවබෝධ කරගත හැකිය. ග්‍රීවාභරණ, කර්ණාභරණ, වළලු, ඉනෙහි පැලඳි ආභරණ, පයෙහි පැලඳි ආභරණ ආදී ලෙස ආභරණ විවිධත්වයක් දැකගත හැකිය. විදේශීය රටවල් සමඟ පැවති සබඳතා හා විදේශීයන්ගෙන් සිදුවූ බලපෑම් ද පුරාණ ආභරණ මගින් හෙළිවන සමාජ කරුණකි. විදේශිය රටවල් සමඟ පැවති දේශපාලන ආර්ථික සංස්කෘතික සබඳතා පිළිබදව ද ඉන් හෙළි වේ. ඉබ්බන්කටුව, අනුරාධපුර, පොලොන්නරුව ආදී ස්ථානවලින් හමුවී ඇති කානීලියන් ආභරණ නිසා ඉන්දියාව හා ශ්‍රී ලංකාව අතර පැවති වාණිජ සබඳතා පිළිබඳ සනාත වේ. අතීත වැසියාගේ සමාජ හා සංස්කෘතික භූමිකාව අධ්‍යයනයේදී ද ආභරණ ඉවහල් වේ. ප්‍රග් ඓතිහාසික යුගයේ සිට මානවයා පැළඳි ආභරණ පිළිබඳ අධ්‍යයනය තුළින් සමාජය තුළ වූ හැසිරීම් රටා, ආගම, සංස්කෘතිය, වෘත්තිය, සමාජ මට්ටම් පිළිබඳ අධ්‍යයනය කළ හැකි බව පෙන්වාදිය හැකිය.

ප්‍රමුඛ පද : ආභරණ, පුරාණ සමාජය, කානීලියන්, ඇදහිළි විශ්වාස, සිතුවම්

[1 2 3] පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය.wathsala1606@gmail.com